**ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.1 **තත්ත්වාගණනය කළ විගණන මතය**

**----------------------------------------**

දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ලෙස දැක්වෙන රු.44,501,040 ක වටිනාකම ශූන්‍ය කර පෙන්වීම සඳහා චක්‍රලේඛයේ 7 (VI) ඡේදය ප්‍රකාරව අක් මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අග්‍රිම සැසඳුම් ප්‍රකාශය සකස් කර මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කල යුතු වීම. | 2018 මූල්‍ය ප්‍රකාශන සමඟ ගැලපුම් ගිණුමක් (සැසඳීමේ ප්‍රකාශය) ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව සහ පසුව එය සකස් කර ඉදිරිපත් කරන බව. |
| (ආ) චක්‍රලේඛය මඟින් ඉදිරිපත් කර ඇති ඒසීඒ 06 ආකෘතියෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව එක් එක් ස්ථාවර වත්කම් වර්ගීකරණය කර එම වර්ගීකරණ කේතයන් යටතේ වත්කම් වටිනාකම වෙන වෙනම දක්වා උප එකතුව දැක්විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එලෙස වර්ගීකරණ කේතයන් යටතේ වත්කම් වටිනාකම වෙන වෙනම නොදක්වා එකතුව පමණක් දක්වා තිබුණි. | චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති ආකෘතිය ප්‍රකාරව වත්කම් වටිනාකම දැක්විය යුතුවීම. | නිරීක්ෂණ හා එකඟ වන බව සහ 2018 වර්ෂය සඳහා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. |

### 1.6.2 මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ-එෆ් ආකෘතිය ප්‍රකාර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ලැබීම් විෂයයන් දෙකක් රු.182,593,185 කින් අඩුවෙන් දක්වා තිබීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් , තැන්පතු ලැබීම් හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට ලැබීම් දක්වා ඇති බව සහ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයේ 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය නිවැරදි කර ඉදිරිපත් කරන බව. |

**1.6.3** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>--------------------- | **නිර්දේශය**<br>------------ | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>---------------------------- |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර වාර්තාවල හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එක් එක් වත්කම්වලට අදාලව වර්ෂය තුල අත්පත් කර ගැනීම් හා අපහරණ අගයන්වල පිළිවෙලින් රු.3,665,059,391 ක හා රු.4,288,223,166 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන වත්කම් අත්පත් කර ගැනීම් සහ අපහරණයන් පිළිබඳව නිවැරදිව භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වන බවත් ඉදිරියේදී නිවැරදි කරන බව. |
| (ආ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය තුල ඉඩම ලෙස රු.630,000,000 ක වටිනාකමක් සඳහන් කර තිබුණ ද ආයතනයේ ඉඩම මෙතෙක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය විසින් කැබිනට් පත්‍රයක් සකස් කිරීමට පියවර ගන්නා බව. |

**1.6.4** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **නිර්දේශය**<br>----------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>-------------------------------- |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශ සමඟ වූ ඒසීඒ- සී ආකෘතිය ප්‍රකාර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ මුදල් ගලාඒම් අයිතම 03 ක් රු.32,383,237 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර මුදල් ගලා යාම් අයිතම 03 ක් රු.52,498,750 කින් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇති බව. |
| (ආ) ඒසීඒ- සී ආකෘතිය ප්‍රකාර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත | - එම - | - එම - |

වූ මුදල් ප්‍රවාහය යටතේ මුදල් ගලා යාම් අයිතම 01 ක් රු.30,374,633 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර මුදල් ගලා යාම් අයිතම 02 ක් රු.54,507,355 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.6.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැඩ තහනමට ලක් වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වසර 5 ක් ඉක්ම වූ රු.473,367 ක ණය ශේෂය අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ණය මුදලක් ආපසු ගෙවා අවසන්වීමට පෙර විශ්‍රාම ගන්නා වූ හෝ මිය යන්නා වූ හෝ සේවය අවසන් වන්නා වූ හෝ නිළධාරියකුගේ ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ජේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | වැඩ තහනම් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය ඥාතිගෙන් සහ ඇප කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. |
| (ආ) | 1995 සිට 2008 දක්වා කාලය තුල දී සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.113,351 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ජේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුවීම. | සේවය හැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීම සඳහා නිතීමය ක්‍රියා මාර්ග ගනු ලබන බව. |

**1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | ------------ | ---------------------------- |
| **(අ) <u>ස්ථාවර වත්කම් ලේඛනය</u>**<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. | පිළිගන්නා බව සහ ඉදිරියේදී සකස් කිරීමට පියවර ගන්නා බව. |
| **(ආ) <u>බැරකම් පිළිබඳ ලේඛනය</u>**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | ඉදිරියේදී යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලබන බව. |

**1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------ | ------------ | ------------------------ |
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ----------------- | ------------------------------ | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| ----------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 94 (i) | වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් මිස කිසිඳු වැඩක් හෝ සේවයක් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විභාග කටයුතුවල ජාතික අවශ්‍යතාවය සලකා මෙම බැඳීම ඇති කර ගන්නා ලද බව. |

| | | | |
|---|---|---|---|
| | හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳිය යුතු වුවත් වැය විෂයයන් 08 ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.75,299,777 ක බැරකම් සඳහා බැඳීම් ඇති කරගෙන තිබුණි. | | |
| **(ii)** මුදල් රෙගුලාසි 396 (ඇ) | ගිණුම් 02 කට අදාලව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්මවූ රු.786,168 ක් වටිනා චෙක්පත් 949 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම චෙක්පත් විභාග රාජකාරිවල නියුක්ත වූ නිලධාරින්ට ගෙවන ලද ඒවා බවත් මේ වන විට මීට අදාළ ගෙවීම් හැකිතාක් නිරවුල් කර ඇති බවත්. |
| (iii) මුදල් රෙගුලාසි 751(5) | තොග හානි සිදු වීම වැලැක්වීමට පියවර ගනිමින් භාණ්ඩවලට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන යෙදිය යුතු වුවත් මුද්‍රණ ගබඩාව සඳහා එලෙස කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර තොග සඳහා ආරක්ෂාව සැපයීම. | ප්‍රමාණවත් ඉඩ කඩ නොමැති වීම නිසා මෙම තත්වය ඇති වී ඇති බවත් නව ගොඩනැගිල්ල ඉදි කළ පසු මෙම ගැටළුව නිරාකරණය වන බවත්. |
| (iv) මුදල් රෙගුලාසි 751 (4) | තොග සටහන්, තොග කාඩ්පත් යනාදිය සමඟ සසඳා පහසුවෙන් හා ඉක්මනින් හරි වැරදි බැලිය හැකිවන පරිදි භාණ්ඩ ක්‍රමානුකූලව පිළියෙල කර තැබිය යුතු වුවත් එක් එක් ගබඩා අයිතමය වෙනුවෙන් බින් කාඩ් ක්‍රමය හෝ ඊට සමාන වැඩි දියුණු වූ වෙනත් ක්‍රම වේදයකට සටහන් තබා ගැනීමක් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර විධිමත් තොග පාලනයක් පවත්වාගෙන යාම. | මේ සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කරමින් පවතින බව. |
| **(v)** මුදල් රෙගුලාසි 762 | අවශ්‍ය භාණ්ඩවල පමණක් තොග තබා ගැනීමටත් පමණට වඩා තොග තබා නොගැනීමටත් සැලකිලිමත් විය යුතු වුවත් පසුගිය වර්ෂ දෙක සමග සසඳා බැලීමේදී තොග අයිතම 18 ක් සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා තොගයක් පවත්වාගෙන | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර කාර්යක්ෂම තොග පාලනයක් පවත්වා ගැනීම. | භාවිතයට නොගන්නා භාණ්ඩ ඉදිරි සති දෙක තුල අපහරණය කිරීමට කටයුතු කරනු ලබන බව. |

ගොස් තිබුණු අතර ගබඩා අයිතම 46 ක් වර්ෂ 1 සිට 7 දක්වා කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සැලසුම් කළ විභාග ප්‍රමාණය අනුව තක්සේරු කළ ආදායම ලෙස රු.මිලියන 350 ක් මූලික ඇස්තමේන්තුවල සඳහන් කර තිබුණි. එහෙත් පසුව මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 100 කින් වැඩි කර සංශෝධනය කර තිබුණු අතර සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 64 ක ආදායම් ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රැස්කර ගැනීමට නොහැකි වී තිබුණි. | අදායම් ඇස්තමේන්තු තාත්විකව හා නිවැරදිව සකස් කිරීමට පියවර ගත යුතු වීම. | භාණ්ඩාගාරය විසින් ඇස්තමේන්තු වෙනස් කළ බව. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගැනීම හා නිශ්චිත සැලැස්මක් අනුව කටයුතු නොකිරීම නිසා වැය විෂයයන් 11 කට අදාලව සියයට 15 සිට සියයට 90 දක්වා පරාසයක රු.159,861,267 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලසුමකින් හා කළමණාකාරිත්වයකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතු වීම. | 2018 වර්ෂයේ අවසාන කාර්තුව තුල අක්මුදල් ලබා දීම ඉල්ලුම් කල ප්‍රමාණයට නොලැබුනු බැවින් ප්‍රතිපාදන ඉතිරි වු බව. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) බැරකම් ලේඛනය අනුව බැදීම් ලෙස දක්වා තිබුණු රු.350,663 ක බැදීම් ශේෂයක් මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර ඇති බැදීම් හා බැරකම් ප්‍රකාශය තුළ දක්වා නොතිබුණි. | වර්ෂය අවසානයේදී බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශ සමඟ අනාවරණය කළ යුතු වීම. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව |
| (ආ) බැදීම් උපලේඛනයට අනුව බැදීම් ලෙස දක්වා ඇති රු.300,000 ක ශේෂයක් බැදීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) බැදීම් හා බැරකම් ප්‍රකාශයේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය යටතේ රු.209,934 ක් ලෙස සටහන් විය යුතු බැරකමක් රු.335,666 ක් ලෙස රු.125,732 වැඩියෙන් සටහන් කර තිබුණි. | - එම - | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) <u>කේවල ප්‍රතිඵල සහතික සිසුන් අතර බෙදා හැරීම</u> | | |
| (i) ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව සිසුන්ගේ කේවල ප්‍රතිඵල සහතික කඩිනමින් සිසුන් වෙත භාරදීමට කටයුතු කරන ලෙස ලිඛිත උපදෙස් දෙමින් පාසැල් විදුහල්පතිවරුන් වෙත යවන නමුත් කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් 09 ක 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විභාග | දෙපාර්තමේන්තුව විසින් මේ පිළිබඳව විදුහල්පතිවරු දැනුවත් කළ යුතු වීම. | පිළිගන්නා බව හා මේ සම්බන්ධයෙන් විදුහල්පත්වරුන් දැනුවත් කිරීමට පියවර ගෙන ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | සහතික 16,368 ක් සිසුන් අතර බෙදා නොහැර පාසැල්වල රඳවා ගෙන තිබුණි. | | |
| (ii) | විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් වෙත නිකුත් කිරීම සඳහා පාසල්වලට යවන මෙම ප්‍රතිඵල සහතික පත්‍ර විධිමත් පරිදි සිසුන් අතට පත් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් අධීක්ෂණයක් පවත්වා ගත යුතු බව. | පිළිගන්නා බව හා පසුවිපරම් කිරීමට සුදුසු පියවර ගෙන ඇති බව. |
| (iii) | අ.පො.ස (සමාන්‍ය පෙළ) හා අ.පො.ස(උසස් පෙළ) විභාගවල ප්‍රතිඵල සහතික ලබා ගැනීම සඳහා දිනපතා ඉතා විශාල සංඛ්‍යාවක් විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන බව නිරීක්ෂණය වන අතර දෙපාර්තමේන්තුව විසින් මුදල් අයකර නිකුත් කරනු ලබන ඉහල ගරුත්වයකින් යුත් ප්‍රතිඵල සහතිකය හෝ ඊට සමාන සහතිකයක් පාසල හරහා නොමිලේ සිසුන් අතට පත් නොකිරීම මෙයට හේතුව වී ඇති බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව විසින් අ.පො.ස (සමාන්‍ය පෙළ) හා අ.පො.ස (උසස්) විභාගවල ප්‍රතිඵල සහතික ඉහල ගුණාත්මකභාවයකින් යුතුව සිසුන් අතට පත් කිරීමට පියවර ගැනීම. | 2019 වර්ෂයේ සිට ඉදිරියට 2019 අ.පො.ස (උ.පෙළ) හා අ.පො.ස (සා.පෙළ) විභාගයේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දී මෙම සහතික පත්‍රය නොමිලේ පිරිනැමීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. |
| **(ආ)** | <u>මුද්‍රණ ගබඩාව</u> | | |
| (i) | ගබඩා විෂයයන් 37 ක් භාවිතයෙන් ඉවත් කිරීමට නිර්දේශ වී තිබුණු අතර එසේ භාවිතයෙන් ඉවත් කිරීමට හේතු වී තිබුණේ එම ද්‍රව්‍ය භාවිතය සඳහා අවශ්‍ය වන යන්ත්‍ර සූත්‍ර භාවිතයේ නොතිබීම බව නිරීක්ෂණය විය. | භාවිතයේ පවතින යන්ත්‍ර පිළිබඳව සැලකිලිමත් වී යන්ත්‍ර වලට අදාළ අයිතම මිලදී ගැනීම. | භාවිතයට නොගන්නා භාණ්ඩ ඉදිරි සති දෙක තුල අපහරණය කිරීමට කටයුතු කරනු ලබන බව. |
| (ii) | මෙලෙස ඉවත් කිරීමට නිර්දේශ කර තිබුණු තීන්ත හා ටෝනර් වර්ග කල් ඉකුත් වීමට පෙර අලෙවි කර පාඩුව අවම කර ගත හැකිව තිබූ නමුත් එලෙස කටයුතු නොකිරීම නිසා වර්ෂ 5 සිට 7 දක්වා කාලයක් එම අයිතම නිශ්කාර්යව ගබඩා කර තිබුණි. | කල් ඉකුත් වූ හා ප්‍රයෝජනයට නොගන්නා විෂයයන් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | භාවිතයට නොගන්නා භාණ්ඩ ඉදිරි සති දෙක තුල අපහරණය කිරීමට කටයුතු කරනු ලබන බව. |
| **(ඇ)** | <u>විභාගවලට අදාළව ලැබෙන පැමිණිලි විමර්ශනය</u> | | |
| **(i)** | විගණනයට ලක් කරන ලද පැමිණිලි 43 ක් අතුරින් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඉදිරිපත් කල පැමිණිලි 17 ක විමර්ශන කටයුතු 2019 අප්‍රේල් 30 වන විටත් අවසන් වී නොතිබුණු අතර පැමිණිලි 05 ක විමර්ශන කටයුතු අවසන්ව තිබුණ ද | විමර්ශන කටයුතු කඩිනමින් ඉටු කළ යුතු වීම. | විමර්ශන අවසන් කිරීමට කටයුතු කරන අතර පැමිණිළි 05 හි විමර්ශන වාර්තා සකස් කිරීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| | ඊට අදාල අවසන් වාර්තා නිකුත් කර නොතිබුණි. | | |
| **(ii)** | 2017 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත /විවෘත තරඟ විභාගයේදී විගණනය හා විමර්ශනය ප්‍රශ්න පත්‍රයේ සඳහන් ප්‍රශ්නවලින් බහුතර ප්‍රශ්න ප්‍රමාණයක් ඇතුළත් පෙරහුරු ප්‍රශ්න පත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධව පැමිණිලිකරුවකු විසින් කරුණු ගොනු කර තිබුණි. පෞද්ගලික ආයතනයක් මගින් ලබා දී ඇති මෙම පෙරහුරු ප්‍රශ්න පත්‍රය පැරණි විභාග ප්‍රශ්න පත්‍රවලින් ලබා ගත් ප්‍රශ්න මගින් සකස් කර ඇති බව විමර්ශනයේදී අනාවරණය වී තිබුණි. මෙලෙස උක්ත විභාගය සමබන්ධයෙන් සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයෙහි බහුතර ප්‍රශ්න ප්‍රමාණයක් පසුගිය විභාග ප්‍රශ්න මගින් ලබා ගෙන සකස් කර ඇති බව තහවුරු වී ඇති බැවින් ආයතනික විභාග ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා ඒ සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ පාලනය සතුටුදායක මට්ටමක නොවුණි. | විධිමත් පරිදි විමර්ශන කටයුතු සිදු කළ යුතු වීම. | එම ගොනුවල කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව. |
| **(iii)** | 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත ප්‍රකාරව විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් වෙනස් කිරීම සම්බන්ධයෙන් වරදකරු වන පුද්ගලයෙකුට එරෙහිව පනත මඟින් නීතිමය ක්‍රියා මාර්ග ගත යුතුය. එහෙත් 1999 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි අයදුම්කරුවෙකු ව්‍යාජ ප්‍රතිඵල සහතිකයක් සකස් කිරීමේ චෝදනාව මත වරදකරුවකු ලෙස විමර්ශන මගින් තහවුරු වී තිබුණ ද පනත ප්‍රකාරව ඔහුට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණු බව ඒ පිළිබඳව සිදු කළ නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | විභාග පනත ප්‍රකාරව නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙහි සඳහන් කරුණු සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා සහතික පත්‍ර ශාඛාවට ලිපිගොනුව 2018 පෙබරවාරි 19 දින යොමු කළ බව. |
| **(iv)** | විභාගශාලාව තුලදී අපේක්ෂකයන් ලඟ තබා ගෙන සිටි ජංගම දුරකථන 604 ක් නිලධාරින් භාරයට ගෙන රඳවා ගෙන තිබුණු අතර ඉන් දුරකථන 481 ක් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල පැවැත් වු විභාග වලට අදාළ දුරකථන බව නිරීක්ෂණය විය.ඒ අනුව මෙම විමර්ශන | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර ජංගම දුරකථන සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගය සම්බන්ධව තීරණයක් ගත යුතු වීම. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර ජංගම දුරකථන සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බව. |

| | | | |
|---|---|---|---|
| | කඩිනම් කර අදාළ දුරකථන සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |

**(ඈ) <u>ප්‍රතිඵල සනාථ කිරීමේ කටයුතු</u>**

| | | | |
|---|---|---|---|
| **(i)** | විභාග දෙපාර්තමේන්තුවට ප්‍රතිඵල සනාථ කිරීම සඳහා වාර්ෂිකව ප්‍රතිඵල සනාථ 111,500 කට අධික ප්‍රමාණයක් ලැබෙන අතර මෙම ප්‍රතිඵල සනාථ කිරීමේ කටයුතු සහ එක්දින සේවාව හා සාමාන්‍ය සේවාව මගින් සහතික පත්‍ර නිකුත් කිරීම යන සියළුම කාර්යන් එකම කාර්ය මණ්ඩලයක් මගින් සිදු කරන බව නිරීක්ෂණය විය. | කාර්ය මණ්ඩලය විධිමත් පරිදි සේවය සඳහා යොදවමින් ප්‍රතිඵල සනාථ කටයුතු කඩිනම් කළ යුතු වීම. | රාජකාරි අවශ්‍යතා පරිදි විධිමත් සැලසුමකට අනුව සහතික පත්‍ර ශාඛාවේ ස්ථාවර කාර්ය මණ්ඩලය මෙම කටයුතු සඳහා යොදවා ඇති බව. |
| **(ii)** | එක් දින සේවය හරහා සහතික පත්‍ර ලබා ගැනීම සඳහා දිනකට විශාල පුද්ගලයන් පිරිසක් පැමිණෙන හෙයින් සහතික පත්‍ර ශාඛාවේ නිලධාරින්ගෙන් වැඩි පිරිසක් එක් දින සේවා කවුළුවේ කටයුතු සඳහා යොදවා තිබුණි. මේ හේතුවෙන් ප්‍රතිඵල සනාථ කාර්යය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් යොදවා ගත නොහැකි වී ඇති අතර මේ අනුව 2018 දෙසැම්බර් 31 දින වන විට 10,660 ක සනාථ කිරීම් සිදු කිරීමට නොහැකි වී තිබුණි. | ප්‍රතිඵල සනාථ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුව විසින් මෙම ගැටලු සහගත තත්වය අවම කිරීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලයීය ප්‍රතිඵල සනාථ කිරීමේ කටයුතු සඳහා මාර්ගගත ප්‍රතිඵල සනාථ කිරීමේ ක්‍රමය (Online Results Confirmations) යටතේ ප්‍රතිඵල සනාථ කර ගැනීමට 5/2018 චක්‍රලේඛය මගින් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත බලය පවරා ඇත. |
| **(iii)** | ප්‍රතිඵල සනාථ කිරීම් සඳහා මාස 03 කට අධික කාලයක් ගත වූ අවස්ථා නිරීක්ෂණය වූ අතර මෙම කාල ප්‍රමාදය හේතුවෙන් නිලධාරින්ගේ උසස් කිරීම් , ස්ථිර කිරීම් සහ මාරු කිරීම් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය. | ප්‍රතිඵල සනාථ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රතිඵල සනාථ කිරීමේ කාලය අවම කිරීම සඳහා සහතික පත්‍ර ශාඛාවේ මාණ්ඩලික නිලධාරීන් විසින් මේ වන විට විධිමත් අධීක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලබන බව. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් දැනුවත් වී තිබුණු නමුත් , එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීමේ වැඩ පිළිවෙල සැලසුම්වලට ඇතුළත් කර එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2030 තිරසර සංවර්ධන ඉලක්ක අනුව දෙපාර්තමේන්තුව සඳහා අදාළ වනුයේ ගුණාත්මක අධ්‍යාපනය යන ඉලක්කය බව සහ මෙම ඉලක්කයට අදාළ දර්ශක සකස් කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත සියළුම ආයතන වල සම්බන්ධීකරණයෙන් බව. |

**5. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කල යුතු ශාඛාවක් වන දත්ත සටහන් ශාඛාව සඳහා විධිමත් පරිදි ස්ථිර දත්ත සහකාර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කිරීමකින් තොරව දත්ත සහකාර තනතුරේ රාජකාරී වන විභාග අයදුම්පත්‍ර තොරතුරු ඇතුලත් කිරීම, විභාගයන්හි ලකුණු ඇතුලත් කිරීම වැනි කටයුතු සඳහා අනියම් පදනමින් බඳවා ගත් සේවකයන් 19 ක් සේවයේ යොදවා තිබුණි. තවද දත්ත සටහන් ක්‍රියාකරුවන් ලෙස අනියම් පදනමෙන් බඳවා ගැනීම සඳහා 26 දෙනෙකුගේ නම් ලැයිස්තුවක් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. | දත්ත සටහන් ශාඛාව සඳහා ස්ථිර දත්ත සහකාර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට ඇති හැකියාව සොයා බැලිය යුතු බව. | ඇගයීම් මණ්ඩලය තුළදී අවසන් ලකුණු තීරණය කිරීම නිසා ලකුණු ව්‍යාපෘතීන්හි අසාමාන්‍ය තත්ත්වයක් නිරීක්ෂණ වූ බැවින් 2018 වසරේ සිට අ.පො.ස. (උ.පෙළ) හා අ.පො.ස. (සා.පෙළ) විභාගවල I පත්‍රය හා II පත්‍රයේ ලකුණු වෙන් වෙන් වශයෙන් ඇතුලත් කිරීමට තීරණය කරන ලදී. එහිදී ඇතුළත් කළ යුතු දත්ත ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වූ බැවින් දත්ත ඇතුළත් කිරීමේ |

| | | | |
|---|---|---|---|
| | | | නිලධාරීන්ගේ හිඟයක් ඇති විය. එම කාර්යයන් කඩිනම් කිරීම සඳහා තාවකාලිකව අනියම් පදනමින් මෙසේ සේවකයන් යොදවා ගන්නා ලද බව. |
| (ආ) | 2016 වර්ෂයේ රු.714,240 ක පිරිවැයක් දරා විභාග දත්ත සහකාර තනතුරු 43 කට බඳවා ගැනීම සඳහා ලිඛිත විභාගයක් , ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබුණි. එහිදී 43 දෙනෙකු විධිමත් පරිදි සුදුසුකම් සපුරා තිබුණ ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ නියෝගයක් මත 06 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. | දත්ත සටහන් ශාඛාව සඳහා ස්ථිර දත්ත සහකාර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට ඇති හැකියාව සොයා බැලීම. | අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය මත මෙම 06 දෙනා බඳවා ගත් අතර ඉතිරි අය බඳවා ගැනීමට එසේ අනුමැතියක් ලැබී නොතිබුණු බව. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව දත්ත සහකාර තනතුර සඳහා තනතුරු 49 ක් අනුමත වී තිබුණ ද එහි තත්‍ය කාර්ය මණ්ඩලය 09 දෙනෙකු පමණක් බව නිරීක්ෂණය වූ අතර ඉතිරි පුරප්පාඩු 40 සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | දත්ත සහකාර තනතුරට අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ දත්ත සටහන් සහකාර පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර දැනට එහි බඳවා ගැනීම් පටිපාටියේ සංශෝධන කිහිපයක් සිදු කරන බැවින් එය නිම වූ පසුව ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව . |
| (ඈ) | දෙපාර්තමේන්තුවේකටයුතු ඩිජිටල්කරණ ව්‍යාපෘතිය යටතේ දත්ත සහකාර ශාඛාවට දත්ත සටහන් ක්‍රියාකරුවන් ලෙස බඳවා ගන්නා ලද අනියම් සේවකයන් 12 දෙනෙකුගේ සේවා කාලය ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 03 ඡේදයට පටහැනිව ඛණ්ඩනය කිරීමකින් තොරව අඛණ්ඩව සේවයේ යොදවා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සේවය ඛණ්ඩනය කල යුතු වීම. | 2018 අ.පො.ස. (උ.පෙළ) හා සා.පෙළ සඳහා තාවකාලිකව අනියම් පදනමින් ඔවුන් සේවයේ යොදවා ගෙන ඇති අතර නැවතත් 2019 අ.පො.ස. උ.පෙළ හා සා.පෙළ විභාග කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ අනියම් පත් කිරීම් කර සේවා ඛණ්ඩනය වන ආකාරයට 2019 මැයි 15 දින නව අනියම් පත්වීම් ලිපි නිකුත් කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දෙපාර්තමේන්තුවට වාර්ෂිකව විභාග සම්බන්ධ පැමිණිලි 2500 කට අධික ප්‍රමාණයක් ලැබෙන අතර මෙම පැමිණිලි විධිමත්ව විමර්ශනය කිරීම සඳහා විමර්ශන නිලධාරින්ට විධිමත් පුහුණුවක් ලබා දී නොමැති බව නිරීක්ෂණය විය. | විමර්ශන නිලධාරින්ට විධිමත් පුහුණුවක් ලබා දිය යුතු වීම. | විමර්ශන නිලධාරීන් සඳහා විධිමත් පුහුණු වැඩසටහනක් 2019 මැයි 22 දින පැවැත්වීමට කටයුතු කර ඇති බව. |